ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>ඉන්දීය වෙරළාරක්ෂක බලකා නෞකා ගාල්ලේ සහ කොළඹ සංචාරයක</u>

ඉන්දීය වෙරළාරක්ෂක බලකායේ ගැඹුරු මුහුද නිරීක්ෂණ නෞකාවක් වන සමර්ථ් නෞකාව සහ වේගවත් නිරීක්ෂණ නෞකාවක් වන අභිනව් නෞකාව 2024 පෙබරවාරි 27 වන දින ගාලු වරායට පැමිණියේය. මෙම නෞකා 2024 මාර්තු 1 වන දා තෙක් ගාලු වරායේ රැඳී සිටින අතර දිවයිනෙන් පිටත් වීමට පෙර මාර්තු 02-05 දිනවල කොළඹ වරායේ සංචාරයක නිරත වනු ඇත. ඉන්දීය වෙරළාරාක්ෂක නෞකාවන්ගේ අණදෙන නිලධාරිවරුන් වන නියෝජ්‍ය පරීක්ෂක ජෙනරාල් පී. ප්‍රදීප් කුමාර් මහතා සහ කොමාන්ඩන්ට් ප්‍රභාත් කුමාර් මහතා ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ අධ්‍යක්ෂ ජෙනරාල්තුමා සහ තවත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමු වනු ඇත.

2. මෙම නෞකා ශ්‍රී ලංකාවේ රැඳී සිටින කාලය අතරතුර ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායට VBSS, ගිනි නිවීම සහ හානි පාලනය සහ සමුද්‍රීය දූෂණ ප්‍රතිචාර යනාදිය සම්බන්ධයෙන් පුහුණුව ලබා දෙනු ඇති අතර තවත් වෘත්තීය නියැළීම් කිහිපයක නිරත වනු ඇත. එසේම, යෝගා ව්‍යායාම, වෙරළ පිරිසිදු කිරීම් සහ ඇවිදීම් වැනි විවිධ වැඩසටහන් ද සංචාරය හා

සමගාමීව සිදු කෙරෙනු ඇත. මෙයට අමතරව, නෞකා දිවයිනෙන් පිටත් වීමෙන් අනතුරුව ගාල්ලට සහ කොළඹට ඔබ්බෙන් ශ්‍රී ලංකා වෙරළාරක්ෂක නෞකාවන් සමඟ සන්නිවේදන සහ සහයෝගීතා අභ්‍යාසයක (PASSEX) ද නිරත වනු ඇත.

3. ජනතාව අතර සම්බන්ධය වැඩි දියුණු කිරීම සහ ඉන්දීය වෙරළාරක්ෂක බලකාය සහ එහි හැකියාවන් පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම සඳහා මෙම නෞකාවන් පාසල් දරුවන් සඳහා විවෘතව තැබෙනු ඇත. ආරක්ෂක අංශයේ සහ සිවිල් පරිපාලන ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළු ශ්‍රී ලාංකික අමුත්තන් සඳහා ප්‍රිය සම්භාෂණයක් ද නෞකාවන් හිදි පැවැත්වෙනු ඇත.

4. ඉන්දීය වෙරළාරක්ෂක බලකායේ මෙම නෞකා ශ්‍රී ලංකාවට පැමිණීම කලාපයේ සමුද්‍රීය ආරක්ෂක අභියෝගයන්ට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ සහ එහි සාමාජිකයන්ගේ හැකියාවන් ඉහළ නැංවීමට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙනු ඇත.

5. ඉන්දීය නාවික හමුදාවේ කෝර්‍රා, කබ්රා සහ කරන්ජ් යන නෞකා සහ සබ්මැරීන් පසුගිය මාස කිහිපය තුළ කොළඹට පැමිණියේය. ඉන්දීය නාවික හමුදාව සහ වෙරළාරක්ෂක බලකාය විසින් ශ්‍රී ලංකාවේ සිදු කරනු ලබන සංචාරයන්ගේ අරමුණ වන්නේ ඉන්දියාවේ කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය (SAGAR) යන දැක්ම සහ “අසල්වැසියා ප්‍රථමයෙන්” යන ප්‍රතිපත්තිය අනුව අසල්වැසි මිත්‍රශීලී රාජ්‍යයන් දෙකෙහි නාවික

හමුදාවන් අතර සහෝදරත්වය සහ කාර්ය සුසංයෝගීතාවය ඉහළ නැංවීමයි.

***

***කොළඹ***
***2024 පෙබරවාරි 28***